# බළන්ගොඩ නගර සභාව

## 2023-01-10 වන දිනැති මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2023.01.10**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති ඩබ්.ජ්. වසන්ත ගුණරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

1. ගරු සභාපති ඩබ්.ජ්. වසන්ත ගුණරත්න මැතිතුමා
2. ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා
3. ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා
4. ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා
5. ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා
6. ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා
7. ගරු නාගරික මන්ත්‍රි එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා
8. ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා
9. ගරු නාගරික මන්ත්‍රිනි ජී. චන්ද්‍රලතා මැතිතුමිය
10. ගරු නාගරික මන්ත්‍රි එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා
11. ගරු නාගරික මන්ත්‍රි එම්. ඩබ්. විමලසිරි මැතිතුමා
12. ගරු නාගරික මන්ත්‍රිනී පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය
13. ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය
14. ගරු නාගරික මන්ත්‍රිනි එම්. ශාන්තිලේඛා මැතිතුමිය
15. ගරු නාගරික මන්ත්‍රි කේ. ජී. පේමදාස මැතිතුමා
16. ගරු නාගරික මන්ත්‍රීනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය
17. ගරු නාගරික මන්ත්‍රී එස්.ඒ.ජෝර්ජ් මැතිතුමා

**නිළධාරි සහභාගීත්වය**

1. ලේකම් ඩී.එම්.ජේ.යූ.ධර්මරත්න මයා

**01. පසුගිය සභාවේ 2022-12-09 දිනැති මහා සභා වාර්තාව සභා සම්මත කිරීම.**

මෙදින මහ සභාවේ වැඩ කටයුතු ආරම්භ කළ ගරු සභාපතිතුමා, ආගම සිහි කිරීමෙන් අනතුරුව සභාව සඳහා සහභාගි වූ ගරු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් ඇතුළු සියළුදෙනා පිළිගන්නා ලදී.

ඉන් අනතුරුව 2022-12-09 දින පැවති මහ සභාවේ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.

මෙහි දී ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා, 2022-12-09 දින පැවති මහ සභාවේ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රීනි ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

අනතුරුව ගරු සභාපතිතුමා විසින් මෙදින සභා වාර්තාවේ සංශෝධනයන් තිබේදැයි විමසූ අතර, සංශෝධන කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් 2022-12-09 දින පැවති මහ සභාවේ සභා වාර්තාව ගරු සභාවේ සභා සම්මත විය.

**පෙ.ව 10.07 ට පමණ ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා සභාවට පැමිණෙන ලදී.**

**02. ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන**

- ❖ පළාත් පාලන ආයතනවල සභිකවරුන්ගේ මාසික දීමනාව ගෙවීම සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස් විසින් 2023-01-03 දිනැතිව එවා ඇති ලිපිය අනුව ඉදිරියට මාසික දීමනා ගෙවීම් සිදු කිරීමට සිදු වන බව පවසන ලදී.
- ❖ පසුගිය දිනක නගර සභා කාර්ය මණ්ඩලය හා එක්ව වර්ෂාවසාන ක්‍රීඩා උත්සවය සාර්ථකව පැවැත් වූ අතර, ඒ සඳහා සභාවේ මුදල් වැය නොකළ අතර, හිතවතුන්ගේ ආධාර අනුග්‍රහය මත සිදු කළ බව පැවසීය.
- ❖ ඉදිරි මාස කිහිපය තුල UNDP ආධාර වශයෙන් රුපියල් ලක්ෂ 700 ක මුදලක් කොම්පෝස්ට් ව්‍යාපෘතිය සඳහා ලැබෙන අතර, එමගින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණයේ දී ඇති වී ඇති ගැටලු සියල්ල නිරාකරණය කර ගැනීමට හැකි වන බව පවසන ලදී.

**03. සංදේශ / පැමිණිලි / පෙත්සම් / ආයාචනා ඉදිරිපත් කිරීම**

- ❖ බළන්ගොඩ නගරයේ ඇති කඩවල සේවය කරන සේවකයන් හා කඩ හිමියන් විසින් ඔවුන්ගේ යතුරු පැදි නැවැත්වීම හේතුවෙන් නගරයට පැමිණෙන පාරිභෝගික ජනතාවගේ වාහන නවතා තැබීමට ඉඩ කඩක් නොමැති වීමෙන් ගැටලුවක් මතු වී ඇති බව ද එම නිසා ඔවුනගේ යතුරු පැදි නවතා තැබීම

සඳහා නගර සභා ක්‍රීඩාංගනය අසල වෙන් කර දෙන ලෙසද එහි ආරක්ෂාව සැලසීම සඳහා සේවක මහතෙකු යෙදවීමට හැකි බැවින් යතුරු පැදිකරුවන්ගෙන් රුපියල් 50.00 ක මුදලක් අය කර ගැනීමට අවසර ලබා දෙන ලෙසද පවසමින් රථවාහන ටෙන්ඩරය ලබා ගත් බළන්ගොඩ, පරණ බස් නැවතුම්පළ, අංක 19 ලිපිනයේ පරගහ අරාවේ සුජීව කුමාර යන අය විසින් එවා ඇති ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

ගරු සභාපතිතුමා පැවසුයේ මේ සඳහා අය කර ගැනීමට අදහස් කරන මුදල ටෙන්ඩරය යටතේම අය කර ගැනීමට ටෙන්ඩර්කරු අපේක්ෂා කරන බවයි.

ගරු සභාපතිතුමා, ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා හා ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් මෙය ක්‍රියාත්මක කිරීම සුදුසු බව පවසන ලදී.

**පෙ.ව 10.16 ට පමණ ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා සභාවට පැමිණෙන ලදී.**

❖ ගලපල්ලේඅරාව මුස්ලිම් කොළණිය හා පීල්ලහේන ගම යා කෙරෙන කුඩා අඩි පාලම ගංවතුර හේතුවෙන් කැඩී විනාශ වී ගොස් ඇති අතර, නව පාලමක් ඉදි කර ගැනීමට සියලු රජයන්ගෙන් ඉල්ලීම් කළ නමුත් එය ඉටු නොවූ බවද ප්‍රදේශවාසී ජනතාවගේ හා පරිත්‍යාගශීලී ප්‍රභූවරුන්ගේ ආධාර උපකාර ඇතිව පාලම සංවර්ධනය කිරීමට කටයුතු කර ඇති නමුත් පාලම ඉදි කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන බවද මේ සඳහා මුදල් හෝ ද්‍රව්‍යමය ආධාරයක් ලබා දෙන ලෙසද ඉල්ලමින් පීල්ලහේන, නව සුහස අවමංගල්‍යාධාර සමිතිය විසින් කරන ලද ඉල්ලීම් ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා අදහස් දක්වමින් යහපාලන ආණ්ඩුව පැවති කාලයේ දී මෙම පාලම ඉදි කිරීමට මුදල් පවා වෙන් කළ නමුත් ආණ්ඩුවේ සිදු වූ වෙනස් වීම මත එම ව්‍යාපෘතිය නතර වූ බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා පැවසුයේ තමන් කිහිපවරක් මෙම යෝජනාව කළ අතර, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා සමග එක්ව පාලම ඉදි කිරීමේ කටයුතු ආරම්භ කිරීමට සූදානම් වූ අවස්ථාවේ ආර්ථික අර්බුදය පැන නැගුණු බවයි.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් 2023-01-05 වන දිනැති මැතිවරණ කොමිෂන් සභාවේ චක්‍රලේඛ අංක 20 මගින් දක්වා ඇති පරිදි මෙම කාල සීමාව ඡන්ද විමසීමේ කාල සීමාව වන බැවින් එම කාල සීමාව තුල මෙවැනි කටයුතු සිදු කළ නොහැකි බව පවසන ලදී.

❖ 2023-01-05 දිනැති මැතිවරණ කොමිෂන් සභාවේ චක්‍රලේඛ අංක 20 *"පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් -2023 රජයට සහ රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවලට අයත් දේපල මැතිවරණ කාල සීමාව තුල දී අනිසි ලෙස භාවිතා කිරීම වැළැක්වීම සහ ඡන්ද විමසීම පැවැත්වෙන පළාත්වලට අදාල නිලධාරීන්, සේවකයන් බඳවා ගැනීම/උසස් කිරීම/මාරු කිරීම සීමා කිරීම"* මැයෙන් ඉදිරිපත් කර ඇති චක්‍රලේඛය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

- ❖ සබරගමුව පළාත් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ අංක CM/DE/05 GOV/ වාර්තා /2022 වෙළුම ii හා 2022-12-27 දිනැති "බළන්ගොඩ නගර සීමාව තුල අත්‍යවශ්‍යයෙන්ම සිදු කළ යුතු සංවර්ධන යෝජනා" යන මැයෙන් එවා ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

- ❖ සබරගමුව පළාත් පාලන කොමසාරිස්ගේ අංක CLG/DE/02/2/1 හා 2022-12-29 දිනැති "රාජ්‍ය වියදම් පාලනය කිරීම" මැයෙන් එවා ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

- ❖ බළන්ගොඩ නගර සභා සීමාව තුල කුමාරගම ග්‍රාම නිලධාරී වසමේ අලාබ්දීන් මාවතේ පිහිටි ඉඩම් කොටසක අසරණ දුගී පවුලක් සඳහා නිවසක් ඉදි කර දීමට අදහස් කර ඇති බැවින් ඒ සඳහා අවසරය ලබා දෙන ඉල්ලමින් බළන්ගොඩ, මිරිස්වත්ත, දේවස්ථාන භාරකාර මණ්ඩලය විසින් එවා ඇති ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

  මේ සම්බන්ධව වැඩ අධිකාරී විසින් ස්ථානීය පරීක්ෂණයක් කිරීමෙන් අනතුරුව ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා පවසන ලදී.

- ❖ බළන්ගොඩ, කිරිඳිගල, අනඳමෙත්ගම පාර, ලිපිනයේ පදිංචි රත්‍රං අරාවේ හිමාෂා හිරුමිණි ධර්මදාස හා විජයසිංහගේ සෙනුර භාෂිත ගුණරත්න යන ශිෂ්‍යයන් දෙදෙනා හට විශ්ව විද්‍යාල ශිෂ්‍යත්ව ලබා දෙන ලෙස ඉල්ලමින් ඉදිරිපත් කර ඇති ඉල්ලුම්පත්‍ර දෙක ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

- ❖ බළන්ගොඩ තානායමේ රට බීම බලපත්‍රය 2023 වසර සඳහා අලුත් කර ගැනීම වෙනුවෙන් ඊට අදාල ගාස්තු වශයෙන් රු. 142,000.00ක මුදලක් ගෙවිය යුතුව තිබූ අතර, වත්මන් බදුකරුගේ බදු කාලය 2023-02-28 දිනෙන් අවසන් වන බැවින් මුළු බලපත්‍ර ගාස්තුවෙන්,

  - ✓ වත්මන් බදුකරුගෙන් ඔහු ගිවිසුම්ගතව ඇති කාලය සඳහා රු. 20,710.00 ක මුදලකුත්,
  - ✓ නව බදුකරුවකු තෝරා ගත් පසු ඔහුගෙන් ඉතිරි බලපත්‍ර ගාස්තු අය කරගන්නා තෙක් ඉතිරි මුදල් වන රු. 121,290.00 ක මුදල නගර සභාව මඟිනුත් ගෙවා රට බීම බලපත්‍රය අලුත් කර ගන්නා ලද බවට ගරු සභාපතිතුමන් විසින් සභාව දැනුවත් කරන ලදී.

- ❖ දිස්ත්‍රික් පළාත් පාලන ආයතන කොට්ඨාස සීමා නිර්ණය කිරීම් කමිටුවේ කෙටුම්පත් යෝජනා ප්‍රාදේශීය දේශපාලන අධිකාරියේ නිරීක්ෂණය සඳහා යොමු කිරීම මැයෙන් රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් 2022-12-24 දිනැතිව එවා ඇති ලිපියෙහි සඳහන් සීමා නිර්ණය පිළිබඳව සභාව දැනුවත් කර අදාල ලිපිය සභාගත කරන ලදී.

**04. ටෙන්ඩර්පත් හා මිළ ගණන් විවෘත කිරීම.**

04:01 2023 වර්ෂය සඳහා අවශ්‍ය ගල්, ගංගා වැලි හා ඇතැම් ඉදිකිරීම් අමුද්‍රව්‍ය සඳහා කැඳවන ලද මිල ගණන් විවෘත කිරීම

මිල ගණන් විවෘත කිරීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අදාළ මිල ගණන් විවෘත කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රීනී ජී.චන්ද්‍රලතා මැතිතුමියගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

ඒ අනුව තිරණ කන්ට්‍රක්ෂන්, B.M.U නිශාන්ත කන්ට්‍රක්ෂන්, T.S.D සොයිසා කන්ට්‍රක්ෂන් හා ලහිරු කන්ට්‍රක්ෂන් යන සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් ලැබී තිබූ අතර, අවම මිල ගණන් හා කොන්දේසි ඉදිරිපත් කළ පහත සඳහන් සැපයුම්කරුවන්ගෙන් ගල් අයිතම, ගංගා වැලි හා ඉදිකිරීම් අමුද්‍රව්‍ය මිල දී ගැනීම හා සේවාව ලබා ගැනීමෙන් පසු මුදල් ගෙවීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

| අයිතමය | මිල රු. | සැපයුම්කරු |
|---|---|---|
| කලු ගල් 6" x 9" | 10,750.00 | තිරණ කන්ස්ට්‍රක්සන් |
| කලු ගල් 4" | 13,950.00 | තිරණ කන්ස්ට්‍රක්සන් |
| කලු ගල් 3" | 15,900.00 | තිරණ කන්ස්ට්‍රක්සන් |
| කලු ගල් 2" | 15,900.00 | තිරණ කන්ස්ට්‍රක්සන් |
| කලු ගල් 1" | 15,100.00 | B.M.U නිශාන්ත |
| කලු ගල් 1 1/2" | 15,000.00 | B.M.U නිශාන්ත |
| කලු ගල් ක්‍රෂර් 3/4" | 15,800.00 | තිරණ කන්ස්ට්‍රක්සන් |
| කලු ගල් 3/4" | 15,800.00 | තිරණ කන්ස්ට්‍රක්සන් |
| කලු ගල් 1/2" | 15,800.00 | තිරණ කන්ස්ට්‍රක්සන් |
| චිප්ස් 1/4 | 15,800.00 | තිරණ කන්ස්ට්‍රක්සන් |
| ගල් කුඩු | 15,800.00 | තිරණ කන්ස්ට්‍රක්සන් |
| ABC මිශ්‍රණය | 15,000.00 | B.M.U නිශාන්ත |
| ගංගා වැලි | 16,300.00 | තිරණ කන්ස්ට්‍රක්සන් |
| බොරලු (ග්‍රැවල්) | 8,000.00 | B.M.U නිශාන්ත |
| පස් | 7,000.00 | B.M.U නිශාන්ත |
| ගඩොල් (9 1/2, 4 1/2, 2 1/4) | 28.00 | B.M.U නිශාන්ත |
| අළු හුණු (25 kg) | 850.00 | තිරණ කන්ස්ට්‍රක්සන් |
| තම්බපු අළු හුණු (25 kg) | 950.00 | තිරණ කන්ස්ට්‍රක්සන් |
| 1" -4×0 - 8"×0-5<br>1" -4×0 - 8"×0-4 | පුරවපු ගල් රු.130<br>පුරවපු ගල් රු.125 | තිරණ කන්ස්ට්‍රක්සන්<br>තිරණ කන්ස්ට්‍රක්සන් |

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05. කල් දී ඇති ප්‍රශ්න**

**05:01 ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය**

05:01:01 මුගුණමලය සුසාන භූමිය නගර සභාවට පවරා ගැනීමේ වර්තමාන ප්‍රගතිය කුමක්ද?
මුගුණමලය සුසාන භූමියෙහි මැනීමේ කටයුතු මිනින්දෝරු අධිකාරියේ නිලධාරීන් විසින් සිදු කළ අතර, එහි පිඹුරු පිටපත් සැකසීම් කටයුතු අවසන් වූ වහාම ඉදිරි පවරා ගැනීම් කටයුතු සිදු කිරීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා පවසන ලදී.

05:01:02 ශෛලතලාරාම මාර්ගය ඉදි කිරීමේ දී අනුර මැදගොඩ මහතාගේ නිවස අසල ද ඩයමන්ඩ් උත්සව ශාලාව අසල කාණු පද්ධතිය ඉදි කිරීම හා නන්දන නිවසට යන ස්ථානය සකස් නොකිරීම සම්බන්ධව ගෙන ඇති ක්‍රියාමාර්ගය කුමක්ද?
කිරිඳිගල නන්දන නිවස අසල මාර්ගය පිළිසකර කිරීම සඳහා දුරකතන ඇමතුමක් මඟින් මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කළ අතර මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ඒ සඳහා අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කරන ලද බව පවසන ලදී.

05:01:03 එහි රැඳවුම් මුදල් නිදහස් කර ඇත්ද? මාර්ග සංවර්ධන අධිකාරියෙන් කරනු ලබයි.

05:01:04 රැඳවුම් මුදල් නිදහස් නොකර ඇත්නම් රැඳවුම් මුදලේ වටිනාකම කොපමණද? මාර්ග සංවර්ධන අධිකාරියෙන් කරනු ලබයි.

05:01:05 කොන්ත්‍රාත්කරුගෙන් එම කර්තව්‍ය ඉටු නොකර ගැනීමට හේතුව කුමක්ද? මාර්ග සංවර්ධන අධිකාරියෙන් සිදු කළ යුතුයි.

**06. කල් දී ඇති යෝජනා**

**06:01 ගරු සභාපති ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා**

06:01:01 බළන්ගොඩ නගර සභාවේ සභාපති වශයෙන් කටයුතු කරන ඩබ්.ඒ.වසන්ත ගුණරත්න වන මා විදේශගත වීමට අපේක්ෂාවෙන් සිටින බැවින් 2023 ජනවාරි 25 වන දින සිට 2023 මාර්තු 25 දින දක්වා වූ මාස 02 ක කාලයක් සඳහා විදේශ නිවාඩු ලබා ගැනීම වෙනුවෙන් සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:02 බළන්ගොඩ ග්‍රාම නිලධාරී වසමේ ඇල්ලෙපොල ගම කඩයිම් සිතියම් අංක 620071 කලාප 07 කැබලි අංක 101න් නිරූපිත මාර්ගය නගර සභා බල ප්‍රදේශයට අයත් මාර්ගයක් බැවින් එම මාර්ගය සංවර්ධනය කිරීම සම්බන්ධව බළන්ගොඩ නගර සභාවේ එකඟතාවය ලබා දීම පිළිබඳව සාකච්ඡා කර තීරණයක් ගැනීම හා ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය අදහස් දක්වමින් මෙම මාර්ගය සඳහා අවශ්‍ය ඉඩ ප්‍රමාණය තමන්ගේ ඉඩමෙන් යන බැවින් තමන් මේ සම්බන්ධව විරුද්ධත්වය පළ කරන බව පවසන ලදී.

මේ සම්බන්ධව වැඩ අධිකාරීතුමාගෙන් කරුණු පැහැදිලි කර ගැනීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

අදාල කරුණු පැහැදිලි කරගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව ගරු සභාව බවට පත් කරන ලදී.

ඒ අනුව ජෝයි සුගන්ධි දේවදාසන් යන අයගේ ඉඩම් කොටස පුද්ගලික ඉඩමකින් කැබලි කරන ලද ඉඩමක් බැවින්ද අදාල මුල් ඉඩම වෙත වෙනත් පිවිසුම් මාර්ගයක් ඇති බැවින් ද දැනට මාර්ගය භාවිතා කරන්නන්ට එහි පරවශ්‍යතා අයිතිය ඇති බැවින් ද දෙපාර්ශවයේ එකඟතාවය හා පහත කොන්දේසි මත පදනම්ව එම මාර්ග කොටස භාවිතා කිරීමට හැකි වන පරිදි හා මලඅාර හරහා එය අවහිර නොවන පරිදි බෝක්කුව ඉදි කර ගැනීම සම්බන්ධයෙන් බළන්ගොඩ නගර සභාවේ විරුද්ධත්වයක් නොමැති බවට තීරණයක් ගෙන එය අදාල පාර්ශව වෙත දැනුම් දීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

**කොන්දේසි,**

I. මලදොලෙහි ජලය ගලා යෑම කිසිදු විටක අවහිර නොවිය යුතුයි.
II. දෙපාර්ශවයේ එකඟතාවය මත ඉදි කිරීම සිදු කළ යුතුයි.
III. මෙම ඉදි කිරීම හේතුවෙන් කිසිදු ගැටලුවක් ඉදිරියේ දී ඇති නොවීමට දෙපාර්ශවය විසින් වග බලා ගත යුතුයි.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:03 බළන්ගොඩ නගර සභාව සතු තානායමේ ප්‍රමාද ගාස්තු වශයෙන් පවතින රු.210,000.00 ක මුදල කපා හැරීම හෝ සහනයක් ලබා දීම සම්බන්ධව තීරණයක් ගැනීම හා ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් බළන්ගොඩ නගර සභාව සතු බළන්ගොඩ තානායමේ වර්තමාන මාසික බදු කුලිය රු. 300,000.00 ක් වන අතර, 2022 මැයි මස සිට සෑම වාරිකයක්ම එක් මසක් ප්‍රමාද වී ගෙවීම හේතුවෙන් මාසිකව රු. 30,000.00 බැගින් නොවැම්බර් මස දක්වා මාස 07ක ප්‍රමාද ගාස්තු වශයෙන් රු.210,000.00 ක් ගෙවිය යුතුව ඇති බව ද ආර්ථික අර්බුදය හේතුවෙන් 2022 මැයි මාසය වෙනුවෙන් 50% ක් ගාස්තු අඩු කිරීම හා මැයි මාසයේ දඩ මුදල වන රු.30,000.00 ක මුදල කපා හැරීම සුදුසු බවට 2022-06-09 දිනැති මහ සභාවේ අංක 05:01:03 යටතේ තීරණයක් ගත් නමුදු ඒ සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මේ වන තෙක් ලැබී නොමැති බව ද පවසන ලදී.

එමෙන්ම ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට ලැබෙන තෙක් මැයි මාසයේ වාරිකය ගෙවීම ප්‍රමාද කළ බවත් එබැවින් දීර්සකාලයක් ප්‍රමාද ගාස්තු එකතු වීම මත රු.210,000.00 ක මුදලක් ගෙවිය යුතුව ඇති බවත් මෙම ප්‍රමාද ගාස්තු කපා හරින ලෙසත් තානායම් ටෙන්ඩර්කරු විසින් ඉල්ලා ඇති බව ද පවසන ලදී.

ඒ අනුව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව බළන්ගොඩ නගර සභාව සතු තානායමේ ප්‍රමාද ගාස්තු වශයෙන් පවතින රු.210,000.00 ක මුදල අය නොකිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:04 ආදායම් එකතු කිරීම සඳහා ක්ෂේත්‍රයේ යන නිළධාරීන්හට මසකට ලීටර 05 බැගින් ඉන්ධන ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් බළන්ගොඩ නගර සභාව වෙත අය විය යුතු වරිපනම්, කඩකුලී,ව්‍යාපාර බලපත්‍ර ගාස්තු ආදී ආදායම් එකතු කිරීම සඳහා ක්ෂේත්‍රයේ යන නිළධාරී මහතුන් වෙත මාසයකට ලීටර 05 බැගින් ඉන්ධන ලබා දීම සඳහා මෙම යෝජනාව ඉදිරිපත් කරන ලද බව පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:05 රථ වාහන හා පෞද්ගලික බස් ගාල් ගාස්තු සඳහා වන ටෙන්ඩර සම්බන්ධයෙන් වන ගාස්තුවලින් 2023 වර්ෂයේ පහත නිවාඩු දිනයන් වෙනුවෙන් සහනයක් ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

- 2023 ජනවාරි 06 - පසළොස්වක පෝය දිනය
- 2023 පෙබරවාරි 04 - නිදහස් දිනය
- 2023 පෙබරවාරි 05 - පසළොස්වක පොහොය දිනය

- 2023 මාර්තු 06 - පසළොස්වක පොහොය දිනය
- 2023 අප්‍රේල් 05 - පසළොස්වක පොහොය දිනය
- 2023 අප්‍රේල් මාසයේ 13 වන දින හා 14 වන දින - සිංහල දෙමළ අළුත් අවුරුද්ද
- 2022 මැයි මාසයේ 1, 05 හා 06 යන දිනයන් - මැයි දිනය, වෙසක් පොහොය දිනය
- 2023 ජූනි මාසයේ 03 වන දින - පොසොන් පොහොය දිනය
- 2023 ජූලි 03 - ඇසල පුර පසළොස්වක පොහොය
- 2023 අගෝස්තු මාසයේ 01 වන දින හා 30 වන දින- නිකිනි පුර පසළොස්වක පෙහොය
- 2023 සැප්තැම්බර් මාසයේ 29 වන දින - බිනර පුර පසළොස්වක පොහොය
- 2023 ඔක්තෝම්බර් මාසයේ 28 වන දින - වප් පුර පසළොස්වක පොහොය
- 2023 නොවැම්බර් මාසයේ 26 වන දින - ඉල් පුර පසළොස්වක පොහොය
- 2023 දෙසැම්බර් මාසයේ 25 හා 26 යන දිනයන් - නත්තල් දිනය හා පොහොය

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

නිවාඩු දිනයන් වන නමුත් වාහන ගමනාගමනය සිදු වන බැවින් මෙම යෝජනාව ගරු සභාවේ ප්‍රතික්ෂේප විය.

06:01:06 2022 ජූලි, අගෝස්තු හා සැප්තැම්බර් මාසවලට අදාලව රු. 36,530.91 ක මුදලක් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.
**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:07 රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 ට අනුව සුළු මුදල් අග්‍රිමය රුපියල් 25,000.00 දක්වා වැඩි කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් බළන්ගොඩ නගර සභා කාර්යාලයේ එදිනෙදා වියදම් පියවා ගැනීම් කටයුතු සඳහා රු.500.00 ක සුළු මුදල් අග්‍රිමයක් මේ වන තෙක් ලබා ගත් අතර, එම මුදල වර්තමානයේ පවතින මිල ඉහළ යාම් හමුවේ ප්‍රමාණවත් නොවන බැවින් සුළු මුදල් අග්‍රිමය රුපියල් 25,000.00 දක්වා වැඩි කිරීම සුදුසු බව පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:08 දේශීය ණය සහ සංවර්ධන අරමුදල මගින් නව බස්නැවතුම්පල සහිත වෙළෙඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා ලබා ගත් ණය මුදල් හා වැසි ජල කාණු පද්ධතිය ඉදි කිරීම වෙනුවෙන් ලබා ගත් ණය මුදල් සඳහා 2023 ජනවාරි මස සිට මාස හයක් යනතුරු පොලිය පමණක් ගෙවීමටත්, පළමු මාස හයෙන් පසු මාසිකව ණය වාරික සහ පොලිය ගෙවීමටත් සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා මේ සම්බන්ධව අදහස් දක්වමින් දේශීය ණය හා සංවර්ධන අරමුදල විසින් මාස 06 ක ණය සහන කාලයට යටත්ව සකසන ලද සංශෝධිත ණය ආපසු ගෙවීමේ ලේඛනය එවා ඇති බව පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:09 එච්.එල්. චන්ද්‍රලතා ඇතුළු දෙල්ගස්වත්ත ගම්වාසීන්ගේ නිවෙස් සඳහා පිවිසෙන මාර්ගය බළන්ගොඩ නගර සභාව වෙත පවරා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ජී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් එච්.එල්. චන්ද්‍රලතා ඇතුළු දෙල්ගස්වත්ත ගම්වාසීන් විසින් ඔවුනගේ නිවෙස් සඳහා පිවිසෙන මාර්ගය බළන්ගොඩ නගර සභාව වෙත පවරා ගන්නා ලෙස ඉල්ලීමක් කර ඇති බව ද එම මාර්ගය පිළිසකර කිරීමට අවශ්‍ය ඉඩම් කොටස් ලබා දීමට ඔවුන් විසින් කැමැත්ත පළ කර ඇති බව ද පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:10 2022-09-20 දින සිට 2022-10-02 දින දක්වා ක්‍රීඩා පිටියේ පැවැත් වූ සංගීත සැණකෙළියෙන් සිදු වූ හානිය ප්‍රතිපූර්ණය කිරීම සඳහා තබාගත් ආරක්ෂිත ඇප තැන්පතු මුදලෙන් ඉතිරි රු.250,000.00 ක මුදල නිදහස් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් 2022-09-20 දින සිට 2022-10-02 දින දක්වා ක්‍රීඩා පිට්ටනියේ පැවැත් වූ සංගීත සැණකෙළියෙන් ක්‍රීඩා පිටියට හානි සිදු වීම හේතුවෙන් එම හානිය ප්‍රතිපූර්ණය කිරීම සඳහා තබා ගන්නා ලද රුපියල් ලක්ෂ 25 ක් වන ආරක්ෂිත ඇප තැන්පතු මුදලින් මේ වන විට රු. ලක්ෂ 20 ක් හා රු.250,000.00 ක් වශයෙන් රු.2,250,000.00 ක මුදලක් නිදහස් කළ අතර ක්‍රීඩා පිටියේ ඉතිරි වී ඇති කාර්යය සඳහා රුපියල් 250,000.00 ක් පමණ රඳවා ගනු ලැබූ බවද එම ඉතිරිව තිබූ කාර්යය මේ වන විට අවසන් කර ඇති හෙයින් ඉතිරි මුදල නිදහස් කර දෙන ලෙස ගිවිසුම්කරු විසින් ඉල්ලීම් ලිපියක් යොමු කර ඇති බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා අදහස් දක්වමින් ක්‍රීඩා පිටිය සැණකෙළිය සඳහා ලබා දීමට පෙර තිබූ තත්ත්වයට තවමත් පත්ව නොමැති අතර, වැඩ අධිකාරී වාර්තාව අනුව ඉතිරි මුදල නිදහස් කිරීම කළ යුතුද නැද්ද යන්න තීරණය කළ යුතු බව ද පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා පැවසූයේ ක්‍රීඩා පිටිය යථා තත්ත්වයට පත්ව නොමැති අතර, ශිරාන් දැල යන අය ගැන පුද්ගලික තරහක් නොමැති බවයි.

ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා අදහස් දක්වමින් වැඩ අධිකාරී වාර්තාව අනුව මුදල් නිදහස් කිරීම හෝ නොකිරීම තීරණය කිරීම සුදුසු බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසූයේ කොන්දේසි ප්‍රකාරව කටයුතු කර ඇති හෙයින් මුදල් නිදහස් කිරීමේ ගැටලුවක් නොමැති බවයි.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රීවරුන් සියලු දෙනා ක්‍රීඩා පිටියට ගොස් නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව මේ සම්බන්ධව තීරණයක් ගැනීම සුදුසු බව පවසන ලදී.

ක්‍රීඩා පිටියේ වත්මන් තත්ත්වය නිරීක්ෂණය කිරීම සඳහා අදාල ස්ථානය වෙත යාම වෙනුවෙන් ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ගරු සභාව පැය භාගයකට පමණ අඩාලව කල් තබන ලදී.

අදාල ස්ථානය නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව අඩාලව කල් තැබූ ගරු සභාව නැවත ආරම්භ කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා ක්‍රීඩා පිටිය යථා තත්ත්වයට පත් වී නොමැති බැවින් ඒ සඳහා රුපියල් ලක්ෂ 01 ක මුදලක් රඳවා ගෙන ඉතිරි මුදල නිදහස් කිරීම සුදුසු බවට යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා ස්ථිර කරන ලදී.

ක්‍රීඩා පිටියේ කාණු ගොඩ වී ඇති නිසා එම කාණු සකස් කිරීම සඳහා රුපියල් ලක්ෂයක මුදලක් රඳවාගෙන ඉතිරි මුදල නිදහස් කිරීම සුදුසු බවට ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් යෝජනා කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් කාණු සකස් කිරීමට නොව හානිය ප්‍රතිපූර්ණය කිරීම සඳහා ගිවිසුම සකස් කර ඇති අතර, සැණකෙළිය මගින් කාණුවලට හානි සිදු නොවූ බව ද කාණුව සකස් කිරීම සභාවේ කාර්යයක් වන බැවින් පවතින වැසි තත්ත්වය පහ වූ පසුව කාණුව සකස් කරන බවද ක්‍රීඩා පිටිය මේ වන විට යථා තත්ත්වයට පත්ව ඇති බැවින් හානිය ප්‍රතිපූර්ණය කිරීම සඳහා තබාගත් ආරක්ෂිත ඇප තැන්පතු මුදලෙන් ඉතිරි රු.250,000.00 ක මුදල නිදහස් කිරීම සුදුසු බවට තමන් යෝජනා කරන බව ද පවසන ලදී.

අනතුරුව ක්‍රීඩා පිටියේ වත්මන් තත්ත්වය සම්බන්ධයෙන් වැඩ අධිකාරීතුමාගෙන් කරුණු විමසීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ගරු සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

අදාල කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රි කේ.ජී. පේමදාස මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව ගරු සභාව බවට පත් කරන ලදී.

මෙහි දී අදහස් දෙකක් ඉදිරිපත් වී ඇති බැවින් ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා 2022-09-20 දින සිට 2022-10-02 දින දක්වා ක්‍රීඩා පිටියේ පැවැත් වූ සංගීත සැණකෙළියෙන් සිදු වූ හානිය ප්‍රතිපූර්ණය කිරීම සඳහා තබාගත් ආරක්ෂිත ඇප තැන්පතු මුදලෙන් ඉතිරි රු.250,000.00 ක මුදල නිදහස් කිරීමට පක්ෂ හා රුපියල් ලක්ෂ 01 ක මුදලක් රඳවා ගෙන ඉතිරි මුදල නිදහස් කිරීමට පක්ෂ බව විමසීම සඳහා බෙදීමක් යෝජනා කරන ලදුව එම යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමී මැතිතුමා ස්ථිර කරන ලදී.

ඒ සඳහා අවශ්‍ය වන්නේ විවෘත ඡන්දයක්ද, රහස් ඡන්දයක්ද යන්න යෝජනා ස්ථිර කර ගන්නා ලෙස ගරු සභාපතිතුමන් විසින් ගරු සභාව වෙත දැනුම් දෙන ලදී.

එහි දී විවෘත ඡන්දයකට යාම සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය ස්ථිර කරන ලදී.

ඒ අනුව 2022-09-20 දින සිට 2022-10-02 දින දක්වා ක්‍රීඩා පිටියේ පැවැත් වූ සංගීත සැණකෙළියෙන් සිදු වූ හානිය ප්‍රතිපූර්ණය කිරීම සඳහා තබාගත් ආරක්ෂිත ඇප තැන්පතු මුදලෙන් ඉතිරි රු.250,000.00 ක මුදල නිදහස් කිරීමට පක්ෂව සභිකයින් දස දෙනෙකු ද එනම්,

1. ගරු සභාපති ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා
2. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා
3. ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා
4. ගරු නාගරික මන්ත්‍රී ජුනයිදීන් මලික්ෂා මැතිතුමා
5. ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා
6. ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා
7. ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය
8. ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා
9. ගරු නාගරික මන්ත්‍රිනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය
10. ගරු නාගරික මන්ත්‍රී එස්.ඒ.ජෝර්ජ් මැතිතුමා ද

2022-09-20 දින සිට 2022-10-02 දින දක්වා ක්‍රීඩා පිටියේ පැවැත් වූ සංගීත සැණකෙළියෙන් සිදු වූ හානිය ප්‍රතිපූර්ණය කිරීම සඳහා තබාගත් ආරක්ෂිත ඇප තැන්පතු මුදලෙන් රුපියල් ලක්ෂ 01 ක මුදලක් රඳවා ගෙන ඉතිරි මුදල නිදහස් කිරීමට පක්ෂව සභිකයින් පස් දෙනෙකු ද එනම්,

1. ගරු උප සභාපති එම්.ටී.එම්. රුමී මැතිතුමා
2. ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා
3. ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා

4. ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය
5. ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය ද ඡන්දය ප්‍රකාශ කළ අතර,

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා සහ ගරු නාගරික මන්ත්‍රීනී එම්.ශාන්තිලේඛා මැතිතුමිය ඡන්දය ලබා දීමෙන් වැළකී සිටින ලදී.

ඒ අනුව 2022-09-20 දින සිට 2022-10-02 දින දක්වා ක්‍රීඩා පිටියේ පැවැත් වූ සංගීත සැණකෙළියෙන් සිදු වූ හානිය ප්‍රතිපූර්ණය කිරීම සඳහා තබාගත් ආරක්ෂිත ඇප තැන්පතු මුදලෙන් ඉතිරි රු.250,000.00 ක මුදල නිදහස් කිරීමේ යෝජනාවට පක්ෂව ඡන්ද 10 ක් ද 2022-09-20 දින සිට 2022-10-02 දින දක්වා ක්‍රීඩා පිටියේ පැවැත් වූ සංගීත සැණකෙළියෙන් සිදු වූ හානිය ප්‍රතිපූර්ණය කිරීම සඳහා තබාගත් ආරක්ෂිත ඇප තැන්පතු මුදලෙන් රුපියල් ලක්ෂ 01 ක මුදලක් රඳවා ගෙන ඉතිරි මුදල නිදහස් කිරීමට පක්ෂව ඡන්ද 05 ක් වශයෙන් ලැබුණි.

ඒ අනුව 2022-09-20 දින සිට 2022-10-02 දින දක්වා ක්‍රීඩා පිටියේ පැවැත් වූ සංගීත සැණකෙළියෙන් සිදු වූ හානිය ප්‍රතිපූර්ණය කිරීම සඳහා තබාගත් ආරක්ෂිත ඇප තැන්පතු මුදලෙන් ඉතිරි රු.250,000.00 ක මුදල නිදහස් කිරීමේ යෝජනාව වැඩි ඡන්ද 05 කින් සභා සම්මත විය.

06:01:11 කාර්යසාධන ණය පියවීම සඳහා වැඩිපුර අය වී ඇති වාරික මුදල් වන රු. 4,342.00 ක මුදල නැවත සරත් ආනන්දසෝම යන අය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:12 කාර්යසාධන ණය පියවීම සඳහා වැඩිපුර අය වී ඇති වාරික මුදල් වන රු. 4,342.00 ක මුදල නැවත ඩබ්.සුසන්ත සුගත්සිරි යන අය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:13 "අවුරුදු උදාන, බළන්ගොඩ -2023 වැඩසටහන" 2023 අප්‍රේල් මස 08 වන දින සිට අප්‍රේල් මස 12 වන දින දක්වා බළන්ගොඩ නගරයම ආවරණය වන පරිදි පැවැත්වීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් මෙම වැඩසටහන වසර 14 ක පමණ කාලයක සිට අඛණ්ඩව පවත්වාගෙන යනු ලබන අතර, 2023 අප්‍රේල් මස 08 වන දින සිට අප්‍රේල් මස 12 වන දින දක්වා

බළන්ගොඩ නගරයම ආවරණය වන පරිදි පැවැත්වීමට අපේක්ෂා කරන බව මාධ්‍යවේදී නාලක ජේ.හෙට්ටිආරච්චි යන අය සඳහන් කර ඇති බව ද එමඟින් සෞඛ්‍ය ආරක්ෂාව, සාමය,ආරක්ෂාව හා අපරාධ වැළැක්වීම ආදී කරුණු පිළිබඳව සාකච්ඡා වන බව ද පවසන ලදී.

ඒ අනුව අවුරුදු උදාන, බළන්ගොඩ -2023 වැඩසටහන" ගාස්තු අයකරගැනීමෙන් අනතුරුව 2023 අප්‍රේල් මස 08 වන දින සිට අප්‍රේල් මස 12 වන දින දක්වා බළන්ගොඩ නගරයම ආවරණය වන පරිදි පැවැත්වීමට අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:14 පොදු වෙළඳසැල අංක 9 හා 10 මාළු කඩ ටෙන්ඩර් කිරීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් පොදු වෙළඳසැල අංක 09 හා 10 මාළු කඩ කාමර ටෙන්ඩර් කිරීමට එරෙහිව ගොනු කර ඇති WA 15/2020 දරණ සබරගමුව පළාත් බද (රත්නපුර) මහාධිකරණ නඩුව මඟින් දක්වා ඇත්තේ සබරගමුව පළාත් පාලන කොමසාරිස්තුමා විසින් නිකුත් කර ඇති 2009/01 චක්‍රලේඛය බල රහිත කරවා දෙන ලෙස වන අතර, පළාත් පාලන ආයතනයේ ප්‍රධාන ආදායම් මාර්ගයක් වන මස් හා මාළු කඩ වාර්ෂිකව ටෙන්ඩර් කර ලබා ගන්නා වූ ආදායම මඟින් නගර වාසීන්ට මහජන උපයෝගිතා සේවාවන් සපයන බවට මහාධිකරණ විනිසුරුවරිය සඳහන් කර ඇති බව ද පවසන ලදී.

ඒ අනුව පළාත් පාලන කොමසාරිස්තුමා විසින් නිකුත් කර ඇති 2009/01 චක්‍රලේඛය ඒ අයුරින්ම ක්‍රියාත්මක කිරීමට පළාත් පාලන ආයතනවලට හැකියාව ඇති බව හා චක්‍රලේඛය බල රහිත කරවා දෙන ලෙස ඉදිරිපත් කර ඇති මහාධිකරණ අයදුම්පත නිශ්ප්‍රභා කර ඇති බව වැඩිදුරටත් ගරු සභාපතිතුමා පැවසීය.

එබැවින් රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කර ඇති මුදල වන රු.10,000.00 ක මුදල අවම ලංසු මුදල වශයෙන් ගෙන විවෘත ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කරමින් බළන්ගොඩ පොදු වෙළඳසැල අංක 09 හා 10 දරණ මාළු කඩ ටෙන්ඩර් කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී. ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07. මන්ත්‍රී යෝජනා**

**07:01 ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය**

07:01:01 අයාලේ යන සුනඛයන් වන්නත් කිරීමේ දී නිසි ක්‍රමවේදයක් අනුගමනය කර එන්නත්කරණය කිරීමට යෝජනා කිරීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය අදහස් දක්වමින් එන්නත් කළ හෝ නොකළ සුනඛයන් හඳුනා ගැනීමේ නිසි ක්‍රමවේදයක් නොමැති බැවින් ගැටලු රාශියක් පැන නගින බවද එම නිසා නිසි ක්‍රමවේදයක් සකස් කිරීම අත්‍යාවශ්‍ය බව ද පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08. කාරක සභා වාර්තා, කමිටු වාර්තා සළකා බැලීම.**

**08:01 2023-01-04 දිනැති කර්මාන්ත කමිටු වාර්තාව**

02.2022 දෙසැම්බර් මස කර්මාන්ත අංශය මගින් සිදුකළ කර්මාන්තවල ප්‍රගතිය පිළිබඳව සාකච්ඡා කිරීම.

03. මන්ත්‍රී යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා නිර්දේශ ලබා ගැනීම

- ගරු සභාපති ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා (යෝජනා අංක 03:01:01 සිට 03:01:03)
- ගරු නාගරික මන්ත්‍රී ඊ.ජේ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා (යෝජනා අංක 03:02:01 සිට 03:02:05 දක්වා)
- ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ( යෝජනා අංක 03:03:01)
- ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා ( යෝජනා අංක 03:04:01)
- ගරු නාගරික මන්ත්‍රීනි ජී .චන්ද්‍රලතා මැතිතුමිය ( යෝජනා අංක 03.05.01 සිට 03:05:03 දක්වා)
- ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා ( යෝජනා අංක 03.06.01 සිට 03:06:08 දක්වා )
- ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා ( යෝජනා අංක 03.07.01 සිට 03:07:10 දක්වා )
- ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා ( යෝජනා අංක 03.08.01 සිට 03:08:05 දක්වා )

**04. ලිපි මගින් ලැබෙන යෝජනා**

- දැඩි ලෙස අබලන්ව ඇති එක්සත් මාවත කඩිනමින් නඩත්තු කිරීම
- බළන්ගොඩ කොටුගොඩැල්ල කොටුව මාර්ගය නඩත්තු කිරීම

ඉහත සඳහන් කර්මාන්ත වෙනුවෙන් යන්ත්‍ර, සේවකයන් හා රථවාහන ලබාගැනීම සඳහාත්, 2022 ජනවාරි මස කර්මාන්ත අංශය මගින් සිදුකිරීමට අපේක්ෂිත කර්මාන්ත සහ නඩත්තු කටයුතු ඉටුකිරීම සඳහාත් නිර්දේශය ලබා දීම

**08:02 2022-12-30 දිනැති මුදල් කමිටු වාර්තාව**

01. බස් නැවතුම්පළ පරවි දැල් ගැසීම වෙනුවෙන් මිලදී ගැනීමේ බිල්පත පියවීම සඳහා අනුමැතිය ලබා ගැනීම

02. RX 2332 ට්‍රේලරය සම්පූර්ණ අලුත්වැඩියා කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම

03. HF-7899 JCB යන්ත්‍රය සඳහා පසුපස 16.9 x 28 ටයර්/ටියුබ් ලබා ගැනීම වෙනුවෙන් මිල ගණන් විවෘත කිරීම

04. සභාව සතු වාහන පූර්ණ සේවා කිරීම 2023 -01-01 සිට 2023-04-01 දක්වා මිල ගණන් විවෘත කිරීම

05. ZA-5039 JCB යන්ත්‍රය අලුත්වැඩියා කිරීම(පිටුපස බකට් එක කැඩී ඇති බැවින් එය සාදා ගැනීම, සයිලංසරය සහ ටර්බෝ එකෙන් දුම් පිටවන බැවින් සාදා ගැනීම, වායු සමීකරණය අලුත්වැඩියා කිරීම)

06. ND-5124 වෑන් රථය (බ්‍රේක් පද්ධතිය) අලුත්වැඩියා කිරීම

07. ගිනි නිවන උපකරණ නැවත පිරවීම සඳහා අනුමැතිය ලබා ගැනීම

08. වීථි පහන් අවශ්‍යතා සඳහා LED බල්බ් 100 ක් හා හෝල්ඩර් 20 ක් මිලදී ගැනීම

09. ටයර් ඩැග් කිරීම

10. ටයර් හා ටියුබ් මිලදී ගැනීම

මෙදින සභාවට ඉදිරිපත් කරන ලද කාරක සභා වාර්තාවල සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් කර්මාන්ත කමිටු වාර්තාවේ 03:04:01 යටතේ තමන් විසින් යෝජනා කර ඇති "පරගහකුඹුර වතුකාරගොඩ මාර්ගය සුද්ධ කිරීම" යන්න " පරගහකුඹුර වතුකාරගොඩ මාර්ගය අලුත්වැඩියා හා සුද්ධ කිරීම" වශයෙන් සංශෝධනය විය යුතු බව පවසන ලදී.

**09. ආදායම් වියදම් වාර්තා සළකා බැලීම.**

**2022-12-01 සිට 2022-12-31 දක්වා ආදායම් හා වියදම්**

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | 11,159,485.79 |
| වෙනත් ලැබීම් | 5,958,386.95 |
| මුලු ලැබීම් | 17,117,872.74 |
| පුනරාවර්තන වියදම් | 14,046,622.20 |
| වෙනත් වියදම් | 6,893,802.90 |
| මුලු වියදම් | 21,290,622.58 |

**2022-12-01 සිට 2022-12-31 දක්වා ඉන්ධන වාර්තාව**

| වාහන අංකය | මුළු එකතුව |
|---|---|
| RD-8000 | 48,600.00 |
| 56-1906 | 40,500.00 |
| 227-5020 | 121,635.00 |
| RD - 8240 | 78,975.00 |
| VI1833 | 5,550.00 |
| 226-7521 | 40,500.00 |
| BC-0005 | 48,600.00 |
| GC 0001 | 16,370.00 |
| LL - 7688 | 56,700.00 |
| JD-4684 | 4,440.00 |
| ND-5124 | 160,380.00 |
| PF-4006 | 198,045.00 |
| QL-2901 | 12,950.00 |

| | |
|---|---|
| RC-1107 | 78,210.00 |
| RC 1118 | 89,100.00 |
| GK 1483 | 50,625.00 |
| ZA- 5039 | 64,800.00 |
| SDRRY0013 | 9,810.00 |
| UQ1933 | 1,480.00 |

| | |
|---|---|
| HF 7899 | 66,675.00 |
| ZA- 0228 | 8,100.00 |
| ZA- 9835 | 12,150.00 |
| RB 4786 | 91,350.00 |
| එකතුව | 1,305,545.00 |

මෙදින සභාවට ඉදිරිපත් කරන ලද ආදායම් වියදම් වාර්තා හා ඉන්ධන වාර්තා සඳහා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**ප.ව 11.15 ට පමණ ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා සභාවෙන් පිටවන ලදී.**

**ප.ව 11.53 ට පමණ ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි විමලසේන මැතිතුමා සභාවෙන් පිටවන ලදී.**

**10. ඇස්තමේන්තු අනුමත කිරීම**

**11. පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්**

**ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය අදහස් දක්වමින් ක්‍රීඩා පිටියේ දුර පැනීම සඳහා අවශ්‍ය වන වල කපා දෙන ලෙසද උඩකන්ද මාර්ගයෙහි පවතින අඩුපාඩු සකස් කර දෙන ලෙසද ඉල්ලමින් ලැබුවා වූ නව වසර සුබ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය අදහස් දක්වමින් ආනන්ද මෛත්‍රී මාවතේ සහ ඇල්ලෙපොල තණකොළ කපා සුද්ධ කර දෙන ලෙස හා ලැබුවා වූ නව වසර සුබ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනී එම්.ශාන්තිලේඛා මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී එම්.ශාන්තිලේඛා මැතිතුමිය අදහස් දක්වමින් තමන් සභාවේ මන්ත්‍රීවරියක් වශයෙන් පත්වී පැමිණීම අහඹු අවස්ථාවක් වුවද මෙම කාල සීමාව තුල වෘත්තිමය වශයෙන් කළ හැකි දේ සභාව වෙනුවෙන් කළ අතර, ඉදිරියේ දී සභාවේ නොසිටියත් වෘත්තිමය වශයෙන් කළ හැකිදේ සිදු කරන බව ද නීතිඥ මහත්මයෙකුගේ සැත්කමක් වෙනුවෙන් සිදු කළ වැඩසටහන් සඳහා ගරු සභාපතිතුමා ඇතුළු නිලධාරීන් දැක්වූ සහයෝගය වෙනුවෙන් ස්තුතිය පළ කරන බව ද පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් පසුගිය දිනක කුරුලු ගිමන්හලක් සම්බන්ධයෙන් කර්මාන්ත කමිටුවේ දී සාකච්ඡා කළ නමුත් මේ වනතෙක් එය ඉටු නොවුණු බව ද කොම්පෝස්ට් අංගනය සඳහා ලැබුණු ව්‍යාපෘතිය පිළිබඳව සතුටට පත්වන බව ද වැසිකිළි ආධාරවල ලබා දීමට ඇති ඉතිරි කොටස ලබා දෙන ලෙසද ඇවිදින මංතීරුව යාවන පාලම සකස් කිරීමට කටයුතු කරන

ලෙසද ක්‍රීඩාංගනය මාර්ගයේ පවතින අනතුරුදායක කොන්ක්‍රීට් ලෑලි පිළිබඳව හා නගරයට පිවිසෙන ස්ථානයේ පවතින පුවරුව නොමැති බැවින් එය නැවත සකස් කළ යුතු බව ද බස්නැවතුම්පළෙහි පැන්තාලිය සවි කිරීමට උත්සාහයක් ගැනීම සුදුසු බව ද ලැබුවා වූ නව වසර සුබ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරන බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා අදහස් දක්වමින් ෆලීල් හාජ්ජියාර් මාවත නඩත්තු කිරීම සම්බන්ධව ස්තුතිවන්ත වන බව ද මුස්තාපා මාවත නඩත්තු කර දෙන ලෙසද කල්තොට පාර සහ අලුත්පාර සඳහා වීථි ලාම්පු සවි කළ යුතු අතර, කහටපිටිය මාර්ගයේ කාණු පිරී ඇති බැවින් සුද්ධ කර දෙන ලෙසද දෙහිගස්තලාව පල්ලිය අසල මාර්ග සංවර්ධන අධිකාරියට අයත් කාණුව සුද්ධ කර දෙන ලෙස එම ආයතනයට දැනුම් දෙන ලෙසද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් උඩකන්ද පාරෙහි පදිංචි පිළිකා රෝගයෙන් පෙළෙන අයෙකුගේ ලිපිය තමන් සභාවට ඉදිරිපත් කරන අතර, ඒ සඳහා හැකි ආධාරයක් ලබා දෙන ලෙසද තමාගේ මෙම මස දීමනාව එම දරුවාට ලබා දෙන ලෙසද මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ඔවුනට අයත් මාර්ග හා කාණු සුද්ධ කිරීම් සිදු නොකරන බැවින් ඒ සම්බන්ධව දන්වා ලිපියක් යොමු කරන ලෙසද පවසමින් මෙම මන්ත්‍රී මණ්ඩලයට නැවත ඡන්දයකින් පත්ව පැමිණීමට හේතු වාසනා වේවායි ප්‍රාර්ථනා කරමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය අදහස් දක්වමින් දෙල්ගස්වත්ත මාර්ගය නඩත්තු කිරීම සම්බන්ධව නැවත මතක් කරන බව ද සුදර්ශන ගම නව ගම්මානයේ මාර්ගය සකස් කර දීම සම්බන්ධව ස්තුතිවන්ත වන අතර, ඉතිරි වී ඇති ඉතා සුළු කොටස සකස් කර දෙන ලෙසද කොම්පෝස්ට් අංගනය සඳහා ලැබෙන රු.ලක්ෂ 700 ක මුදල සම්බන්ධව සතුටට පත්වන බව ද පවසමින් මෙම මන්ත්‍රී මණ්ඩලයට නැවත ඡන්දයකින් පත්ව පැමිණීමට හේතු වාසනා වේවායි ප්‍රාර්ථනා කරමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා අදහස් දක්වමින් පිරිවන කුමාරගම මාර්ගය අබලන් වී ඇති අතර, වතුර ටැංකිය අසලින් ඉහළට යන මාර්ගය දෙපැත්ත සුද්ධ කර දෙන ලෙසද ඒ සඳහා මන්ත්‍රීවරුන් සම්බන්ධ නොවී නිලධාරීන් සම්බන්ධ කර ගන්නා ලෙසද දුනුගහමඩලවත්ත දැන්වීම් පුවරුව සවි කර ගැනීමට කම්කරුවන් නොමැති නම් එම ගමෙහි සමිතිය විසින් එය ඉටු කර ලීමට හැකි බව ද ජෙයරාජන් මහතාගේ නිවස තුලට ප්‍රධාන මාර්ගයේ ජලය ගලා එන බැවින් කුඩා ගැට්ටක් වශයෙන් නිවස ඉදිරිපිට සකස් කර දෙන ලෙසද පවසන ලදී.

එමෙන්ම මැතිවරණය කල් දැමීම මඟින් යළි ජනතා නැගිටීමක් සිදු විය හැකි අතර, බ්‍රසීලයේ ඉරාකයේ පවා එවැනි සිදුවීම් සිදු වන බව ද මැතිවරණ කොමිෂමේ හතර දෙනා අතර ගැටුමක් ඇති කර ඔවුන්

ඉවත් වුවහොත් අර්බුදයක් ඇති විය හැකි බව ද මැතිවරණය සඳහා මුදල් 2021 අයවැය මගින් පවා වෙන් කර ඇති අතර, එසේ නොමැති නම් ඒකාබද්ධ අරමුදලින් ගත හැකි බව ද අද වන විට පොදු ජන පෙරමුණ බෙදී වෙන් වෙන් පක්ෂයන් වශයෙන් තරඟ කරන බව ද පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා තවදුරටත් අදහස් දක්වමින් පළාත් පාලන ආයතන ජනතාවට සමීපතම ආයතන වන අතර, ප්‍රජාතන්ත්‍රවාදය අගයන දේශපාලන ව්‍යාපාරයක් වශයෙන් එය වගකීමක් ලෙස සලකා ඉටු කරන බව ද ලැබුවා වූ නව වසර සියලු දෙනාට සුබ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා අදහස් දක්වමින් ඡන්දදායකයන් අප ගැන තැබූ විශ්වාසය මත ඡන්දය ලබා දුන් අතර, ජනතාවට සේවය කිරීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දුන් ගරු ජනාධිපතිතුමා ඇතුළු සියලුම දෙනාට ස්තුතිවන්ත වන බව පවසමින් හා ලැබුවා වූ නව වසර සියලු දෙනාට සුබ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**12. අවසානය**

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් වරින් වර සභාව විසුරුවන බවට ආරංචි පැමිණියත් මාර්තු 19 වනතුරු සභාව පවතින බවට තමන් විශ්වාස කරන බවද තමන් මෙන්ම පෙර සිටි සභාපතිවරුන්ද යම් සේවයක් බළන්ගොඩ නගරයේ ජනතාවට සිදු කළ අතර තමන් පාලනය කළ මාස 09 ක කාලය තුල කිසිවෙකුට විශේෂයක් නොකර සියලුම දෙනාට අවශ්‍ය උදව් උපකාර කළ බව ද ඉදිරි මැතිවරණයේ දී දේශපාලන කණ්ඩායම් විශාල ප්‍රමාණයක් සිටින බැවින් එක් කඳවුරකට වැඩි බලයක් ලබා ගැනීමට නොහැකි විය හැකි අතර, එසේ ආසන බෙදී යාමෙන් සභාව පවත්වාගෙන යාම අපහසු බව ද පවසන ලදී.

කෙසේ වෙතත් ඉදිරි මැතිවරණයට ඉදිරිපත් වී ජයග්‍රහණය කර මෙම සභාවට පත්ව පැමිණීමට සියලු දෙනාටම අවස්ථාව ලැබේවායි ප්‍රාර්ථනා කරමින් හා ලැබුවා වූ නව වසර සියලු දෙනාට සුබ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරමින් අද දින සභාවේ කටයුතු සාර්ථක කර ගැනීමට සහභාගි වූ ගරු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් සියලු දෙනාට ස්තුතිය පළ කරමින් මෙදින මහ සභාවේ වැඩ කටයුතු ප.ව.12.50 ට පමණ අවසන් කරන ලදී.

එම්.ටී.එම්.රූමි,
සභාපති,(වැ/බ)
බළන්ගොඩ නගර සභාව.